29|02|2016

Learning Resource Center
R
De Mazenod College
Kandana

**ද මැසනඩ් විද්‍යාලය**

2016 උසස් පෙළ විභාගයට පෙනී සිටින සිසුන් වෙනුවෙන් පැවැත්වෙන කඩයිම් වාර පරීක්ෂණය

2016 අප්‍රේල්

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය.**

**කාලය පැ. 02**

■ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

**I - කොටස**

01. නායකත්ව කාර්යයට ප්‍රමුඛතාවය ලැබෙන්නේ පහත සඳහන් කුමන අවස්ථාවේදීද?
   i. අන්තර් පුද්ගල සන්නිවේදනයේදී
   ii. සංවර්ධන සන්නිවේදනයේදී
   iii. සමූහ සන්නිවේදනයේදී
   iv. නිර්මාණාත්මක සන්නිවේදනයේදී
   v. චිත්‍රපට අධ්‍යක්ෂකවරයාගේ භූමිකාවේදී

02. ග්‍රාහකයා විසින් සිය සන්නිවේදකයාට ප්‍රතිචාර දැක්වීමේදී පෙරලා ප්‍රශ්න විචාරයක යෙදේ. එය හඳුනා ගත හැක්කේ,
   i. අත්දැකීම් ක්ෂේත්‍රය පිළිබඳ ඇති අවබෝධය
   ii. මූලාශ්‍රය පිළිබඳව ඇති අවබෝධය
   iii. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදන හැකියාව
   iv. සහානුභූතිය
   v. සමාජානුයෝජනය

03. ඉලක්ක කර ගත් පිරිසක් වෙත වැඩ දායි වන අයුරින් ප්‍රකාශ වූ කරුණක් නැවත නිවැරදි කිරීමකට භාජනය කරන්නේ නම් ඒ සඳහා භාවිතා කරන්නේ
   i. පුවත්පත් මාධ්‍යය    ii. රූපවාහිනී මාධ්‍යය
   iii. මාධ්‍ය නිවේදනය    iv. පුද්ගල සම්බන්ධතා
   v. දැන්වීම් මාධ්‍යය

04. සංවර්ධන ව්‍යාපෘතියකදී එය සාර්ථක කර ගැනීමට තිබිය යුත්තේ
   i. වෙන් කරන ලද ප්‍රමාණවත් මුදල    ii. ව්‍යාපෘතිය සඳහා කරන ලද පූර්ව පර්යේෂණ
   iii. ව්‍යාපෘතියට අවශ්‍ය ඇගයීම    iv. මානව සම්පත
   v. ප්‍රජා සහභාගීත්වය

05. වීදි නාට්‍ය ගැන සාවද්‍ය ප්‍රකාශයක් විය හැක්කේ
   i. අදාල පිටපත අනුව රඟ දැක්වීමයි.    ii. නිර්මාණාත්මක බවින් තොර වීමයි
   iii. වෘත්තීමය නළු ළිතියන් නොමැති වීමයි.
   iv. සුදුසු මාධ්‍ය කුමක්දැයි කලින් තීරණය කර නොතිබීමයි.
   v. ජන වහර යොදා ගැනීමයි.

06. සමාජ අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් මාධ්‍ය භාවිතා කරන්නෙකු
   i. දානපතියෙකි    ii. මාධ්‍යවේදයෙකි
   iii. පුවත්පත් ආචාර ධර්ම සුරකින මාධ්‍ය වේදියෙකි
   iv. දක්ෂ සන්නිවේදකයෙකි.    v. පුරවැසි මාධ්‍යකරුවෙකි.

07. පාලක පක්ෂය වෙතට සිය ගැටළු ගැඹුරු ලෙස විමර්ශනයට භාජනය කර ක්‍රියාවට නැංවීමට අවශ්‍ය අනුමැතිය ලබාදීම නම්
   i. ඉහළ අතට සිදුවන සන්නිවේදනය    ii. හරස් අතට සිදුවන සන්නිවේදනය
   iii. ප්‍රමාණීකරණය    iv. සාර්ථක කණ්ඩායම් සන්නිවේදනය
   v. සමාජ කණ්ඩායමක වගකීම.

08. ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතියකදී යොදා ගත හැකි පහසු සන්නිවේදන විධික්‍රමය වන්නේ
i. නිර්වාචික ii. රූපයමය iii. ශබ්දමය iv. වාචික v. නිර්මාණාත්මක

09. සමාජීය සමූහයන්ගේ ව්‍යුහමය ලක්ෂණ, සංකල්පනා, විශ්වාස ආදියෙන් සමන්විත සංස්කෘතික නිර්වචනයන් පවා වෙනස් කරන්නට වර්තමාන මාධ්‍ය ක්‍රියා කරයි. ඊට බලපෑමක් ලෙස දැකිය හැක්කේ,
i. සන්නිවේදන තාක්ෂණයේ දියුණුවයි.
ii. මිනිසුන්ට මාධ්‍යයෙන් කරන බලපෑමයි
iii. මාධ්‍යයට ව්‍යාපාර ප්‍රජාවගෙන් කෙරෙන බලපෑමයි
iv. මාධ්‍ය විසින් ඇති කරන්නට තැත් කරන සමාජ ව්‍යුහයේ මූලික ලක්ෂණයි
v. මාධ්‍ය සාක්ෂරතාවයක් නොමැති සමාජයක් ඉල්ලා සිටින අවශ්‍යතාවයයි.

10. මාධ්‍ය සංස්කෘතිය නිසි අයුරින් පැහැදිලි නොවන වගන්තියක් වන්නේ,
i. එහි සංසරණය ඒකමාර්ගිකය
ii. එහි ජාතික සංස්කෘතිය නිරූපණය කලද ඒ ගැන අභිමානයක් නොමැති තරම්ය.
iii. එය මාධ්‍ය සාක්ෂරතාව සමග අත්වැල් බැඳගෙන ඇත.
iv. එහි මතුපිට පෙන්වන කරුණෙහි ව්‍යාජ අරමුණු නැත
v. එය මාධ්‍ය සාක්ෂරතාව ඇති නැති සැමට පොදු වේ.

11. A සංස්කෘතික ආක්‍රමණයක් යනු ස්වභාවිකව සිදු වන්නකි.
B සංස්කෘතික ආක්‍රමණයක් යනු සැලසුම් සහගතව සිදුවන්නකි.
C සංස්කෘතික ආක්‍රමණය සැලසුමකින් තොරව සිදුවන්නකි.
D සංස්කෘතික ආක්‍රමණය සැලසුමක් සහිතව හෝ රහිතව සිදුවන්නකි.
ඉහත ප්‍රකාශ වලින් සත්‍ය විය හැක්කේ,
i. A ii. B iii. C iv. D v. සියල්ලම

12. මානව ඉතිහාසයේ සැහෙන කාලයක සිට විවිධ අයුරින් සංස්කෘතික කම්පනයන් මිනිසාට ඇතිවිය. එලෙස වීමට හේතුවක් විය නොහැක්කේ,
i. සංස්කෘතික ආක්‍රමණය සිදු වීම ii. විරෝධී සංස්කෘතීන් බිහිවීම
iii. සංස්කෘතික හුවමාරුව ඇති වීම iv. උප සංස්කෘතීන් බිහි වීම
v. තරුණ අරගල ඇතිවීම

13. සන්නිවේදන ක්‍රියාවලිය එක් ස්ථානයකින් ආරම්භ වී තවත් ස්ථානයකින් කෙළවර නොවන්නේ,
i. සන්දේශය ප්‍රති නිර්මාණය සඳහා මෙවලම් පවතින නිසාය
ii. සන්නිවේදනය යනු මානව ක්‍රියාවලියක් වන නිසාය.
iii. සන්නිවේදනයට වේලාවක්, ස්ථානයක්, නොමැති නිසාය
iv. සන්දේශය ජංගම වශයෙන් ගෙන යා හැකි නිසාය
v. සන්නිවේදනය යනු එක් පුද්ගලයෙකුට පමණක් අයිති නැති බැවිනි.

14. සන්නිවේදකයා හා ග්‍රාහකයා සමාජ විද්‍යාත්මකව එක සමාන බව පැහැදිලි කළේ,
i. ශ්‍රාම් ii. ලැස්වෙල් iii. බර්ලෝ iv. ෂැනොන් වීවර් v. ඇරිස්ටෝටල්

15. ජනමාධ්‍යයේ ස්වභාවය අනුව අධ්‍යාපනික කාර්යය පහසුවෙන් හා හොඳින් සිදු කළ හැක්කේ,
i. පුවත්පත් මාධ්‍යය තුල ii. ගුවන් විදුලි මාධ්‍යය තුල
iii. රූපවාහිනී මාධ්‍යය තුල iv. සිනමා මාධ්‍යය තුල
v. නව මාධ්‍යය තුල

16. සරල මානව ක්‍රියාවක් වටා බලපාන අනෙකුත් සමාජීය සාධක සහිතව හෝ මනෝභාවයන් වඩාත් හොඳින් ප්‍රකට කළ හැක්කේ
i. කටකතා මාධ්‍ය තුල ii. ගුවන් විදුලි මාධ්‍යය තුල
iii. රූපවාහිනී මාධ්‍යය තුල iv. සිනමා මාධ්‍යය තුල
v. නව මාධ්‍යය තුල

17. භාෂා උපාර්ජනය යනු
i. භාෂාවේ අනන්‍ය ලක්ෂණ හඳුනා ගැනීම ii. පවතින වචනවලට වෙනත් අරුත් සැපයීම
iii. ග්‍රහණය කර පරිශීලනය කිරීම iv. භාෂා රීති ඉගෙන ගැනීම
v. උප සංස්කෘතියේ භාෂා නිර්මාණය

18. යම් සමාජ කොට්ඨාශයක නවීකරණය යනු
A නවීකරණය යනු කලාත්මක ශෛලීය ක්‍රමයකි.
B. නවීකරණය යනු සංස්කෘතිය වෙනස්වීමකි
C. නවීකරණය යනු අනුකරණයකි
D. නවීකරණය යනු මිත්‍යාවාදී ම පද්ධතියකි.
E. නවීකරණය යනු සමාජ විකාශනයේ ප්‍රතිඵලයකි
ඉහත ප්‍රකාශ වලින් වඩාත් නිවැරදි ප්‍රකාශන ලෙස පිලිගත හැක්කේ.
i. A, B, C, D ii. B, C, D, E iii. B, C, E iv. C, D, E v. සියල්ලම

Learning Resource Center
R
De Mazenod College
Kandana

19. බර්ලෝගේ ආකෘතිය තුලින් වඩාත් හොඳින් අධ්‍යයනය වන ක්ෂේත්‍රය,
A දේශපාලන ක්ෂේත්‍රය
B. මනෝවිද්‍යාත්මක ක්ෂේත්‍රය
C. ආගමික් ක්ෂේත්‍රය
D. සමාජ විද්‍යාත්මක හා ජීව විද්‍යාත්මක ක්ෂේත්‍රය
මින් නිවැරදි වන්නේ,
i. A ii. B iii. C iv. D v. සියල්ලම

20. රූපවාහිනී රියැලිටි වැඩසටහනක් මගින්
i. පුද්ගලයාගේ අධිමානසික ස්වභාවයන් පිළිඹිඹු කරයි.
ii. සමාජයේ එක් පැතිකඩක් පිළිඹිඹු කරයි
iii. සමාජය ඉල්ලා සිටින දේ පිළිඹිඹු කරයි
iv. පුද්ගලයා පත් විය යුතු ස්වභාවය පිළිඹිඹු කරයි.
v. මාධ්‍ය ආයතනයට අවශ්‍ය දේ පිළිඹිඹු කරයි.

21. පුරවැසි ජනමාධ්‍ය ඇති සමාජයක් හඳුනා ගත හැක්කේ,
i. නිදහස් මතවාදී සංකල්ප සහිතවය ii. අධිපතිවාදී සන්නිවේදන සංකල්ප සහිතවය
iii. ප්‍රජාතන්ත්‍රවාදී සංකල්ප සහතිවය iv. සන්නිවේද මෙවලම් බහුල සමාජයක් සහිතවය
v. ඇති නැති භේදයක් රහිත සමාජයක් ලෙසය.

22. A ස්ථාවර දුරකථන B.ජංගම දුරකථන
C. සාමාන්‍ය තැපැල් සේවාව D. ඊ මේල් E.කෙටි පණිවිඩ
දීප ව්‍යාප්තව ඇති දියුණු සංවිධානයක පරිපාලන කටයුතු පහසු කරවන්නේ,
i. A ii. B iii. C iv. D v. E

23. නවෝත්පාදන විසරණය ගැන අදහස් මතුකලේ,
i. ශ්‍රාම් ii. ඔස්ගුඩ් iii. එවරට් එම් රොජර්ස් iv. වීවර් v. ඩැනියෙල් ලර්නර්

24. බලවත් සමාජයක් විසින් තම සංස්කෘතිකාංග දුර්වල සමාජයකට අවශෝෂනය කිරීම
i. සංස්කෘතික ලැග්මයි ii. සංස්කෘතික ආක්‍රමණයයි
iii. සංස්කෘතික සම්පර්කයයි iv. සංස්කෘතික රාශිකෘතයයි
v. උප සංස්කෘතිය බිහිවීමයි.

25. ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයක් ලෙස නිදහසේ මාධ්‍ය වලට හැසිරීමට ඉඩ ඇරීම
i. බුද්ධිමත් සමාජයට කරන ගරු කිරීමයි
ii. ජන සංස්කෘතික ලක්ෂණ තුලින් මාධ්‍ය පෝෂණය කිරීමයි
iii. බටහිර කරණයයි iv. නිදහස් මතවාදී සන්නිවේදන ලක්ෂණයි
v. සමාජ වගකීම් පිළිබඳ සන්නිවේදන සංකල්පයයි.

26. ස්වදේශිකත්ව අන්තර්ඥානය දැකිය හැකි නොහැකි වන්නේ,
i. ජන කවි වල ii. අන්තර්ජාලය තුළ iii. ජනකථා වල iv. ආයුර්වේදය තුළ v. ප්‍රස්ථාපිරුළු වල

27. ගෘහස්ථ සාමය පවත්වා ගැනීමට එතරම් අවශ්‍ය නොවන්නේ,
i. මාධ්‍ය සාක්ෂරතාවය ii. ප්‍රශස්ථ සංජානනය
iii. ප්‍රශස්ථ ප්‍රතිචාර iv. ඵලදායී කථනය v. ඉසුරුමත් ආර්ථිකය

28. විචාරශීලී ග්‍රාහකයෙකු තුළ දැකිය නොහැක්කේ,
i. මාධ්‍ය සාක්ෂරතාවය ii. මාධ්‍ය අධ්‍යාපනය iii. සහානුභූතිය
iv. සමාජානුයෝජනය v. අනුකරණය

29. සංවර්ධන සන්නිවේදනයේදී ප්‍රමාදිත බහුජනතාව ලෙස හඳුනා ගැනෙන්නේ,
i. ව්‍යාපෘතියට පසු වී සම්බන්ධ වන ජනතාව
ii. ව්‍යාපෘතිය මගින් සිදුවන්නේ කුමක්දැයි සොයා බලා සම්බන්ධ වන ජනතාව
iii. ප්‍රමාදිත ප්‍රතිපෝෂණය සහිත පිරිස iv. සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවන්නට බැරි පිරිස
v. නූගත් ජනතාව

30. සමූපකාර සමිති ව්‍යාපාරය සඳහා නොගැලපෙන ප්‍රකාශය වන්නේ,
i. ස්වෙච්ඡා ව්‍යාපාරයකි. ii. ගැමියන්ට සකසුරුවම් හා ණය දීමේ ව්‍යාපාරයකි
iii. 1940 දී ආරම්භ විය iv. ගතික සංවිධානයකි
v. රජයේ අනුග්‍රහය ලබන මහජන ව්‍යාපාරයකි.

31. සංවර්ධනය පිළිබඳ ආකල්පමය ගැටළුවක් වන්නේ,
i. නියමිත ප්‍රජාව සහභාගී නොවීම ii. සන්නිවේදන මාධ්‍ය දේශපාලනීකරණය වීමයි
iii. දැඩි සම්ප්‍රදායික බව iv. මාධ්‍ය සාක්ෂරතාවයේ ඌණතාවය
v. සමාජානුයෝජන ක්‍රියාවලිය නිසි ලෙස සිදු නොවීම

32. ගැල්ටුංගේ ගැටුම් ත්‍රිකෝණය වන්නේ,
i. දේශපාලනය, ආගම, සංස්කෘතිය ii. දේශපාලනය, විධායකය, ව්‍යවස්ථාදායකය
iii. ව්‍යුහය, ආකල්ප, චර්යාව iv. අයහපත් චර්යාව, අයහපත් ආකල්ප, චර්යාව
v. සමාජ ව්‍යුහය, සමාජ ආකල්ප, නීතිය

33. පුද්ගලයා තුල ගැටුමක් ඇති කිරීම අවම කර ගැනීම සඳහා
i. නිතර මාධ්‍ය හා ගැවසිය යුතුය ii. ''සාර්ථක ජීවිතයකට මඟ'' කියවිය යුතුය.
iii. භාවනාව පුරුණු කළ යුතුය
iv. තමා තුල ඇති වන වේදනාකාරී අවස්ථාවන් සමීපතමයෙකුට පැවසිය යුතුය.
v. සරල දිවි පෙවතක් ගත කිරීමට උත්සාහ කළ යුතුය.

34. සංවර්ධන සන්නිවේදනය ගැන පහත නිවැරදි වාක්‍යය තෝරන්න.
i. සංවර්ධය සඳහා සන්නිවේදන සංකල්පය 1950 දශකයේදී යුනෙස්කෝව ප්‍රකාශ කළේය.
ii. සංවර්ධන සන්නිවේදනය පිළිබඳ අර්ථකථනය 1960 දී යුනෙස්කෝව ප්‍රකාශ කළේය.
iii. සංවර්ධය සඳහා සන්නිවේදන යොදවන අයුරු 1970 දී යුනෙස්කෝව ප්‍රකාශ කළේය.
iv. පිලිපීන විශ්ව විද්‍යාලය 1970 දී සංවර්ධන සන්නිවේදන නිර්වචනය ප්‍රකාශ කළේය.
v. 50 දශකයේ ඇති වූ ලෝක යුද්ධයෙන් පසු යුනෙස්කෝව එය ප්‍රකාශ කළේය.

35. සංවර්ධන සන්නිවේදන ව්‍යාපෘතියකදී සම්ප්‍රදායික මාධ්‍යයේ වාසිය වන්නේ,
i. අඩු වියදම ii. දේශීය අනන්‍ය තාවය iii. ග්‍රාහක ක්‍රියාකාරී සහභාගීත්වය
iv. නිර්මාණාත්මක බව v. විශ්වාසනීයත්වයෙන් තොර වීම.

36. දෙපියවර ආකෘතිය හඳුන්වා දෙන ලද්දේ,
i. ශ්‍රාම් ii. ලෙසාෆීල්ඩ් iii. ලැස්වෙල් iv. වීවර් v. විමල් දසානායක

37. ආයතනයක කීර්තිනාමය ගැන සඳහන් වන මහජන සම්බන්ධතා නිර්වචනය ඉදිරිපත් කළේ.
i. බ්‍රිතාන්‍ය ii. ඇමරිකාව iii. ඉන්දියාව iv. එඩ්වඩ් එල්. බර්නිස් v. අයිවිලි

38. A විචිත්‍ර ලෙස දක්විය හැක
B. අසත්‍ය ප්‍රකාශ පහසුවෙන් සමාජ ගත කළ හැක
C. මිනිසුන්ගේ චර්යාවන් වැඩි වශයෙන් දැන ගත හැක
D. නියාමනය අපහසුය
A, B, C, D මගින් කියවෙන්නේ,
i. ගුවන් විදුලි මාධ්‍යය හා අන්තර්ජාලය ගැනයි ii. අත් පත්‍රිකා හා මුද්‍රිත මාධ්‍ය ගැනයි.
iii. රූපවාහිනිය හා යූ ටියුබ් ගැනයි iv. කටකතා හා අන්තර්ජාලය ගැන
v. විකල්ප මාධ්‍ය හා දේශපාලන වේදිකාව ගැනයි

39. A සහභාගීත්ව තීරණ ගැනීම
B මාධ්‍ය ඒකාබද්ධතාවය
C අන්තර් පුද්ගල විශ්වාසය
ඉහත කරුණු සාකච්ඡාවට බඳුන් වන්නේ
i. සමාජානුයෝජනය තුළ ii. කණ්ඩායම් සන්නිවේදනය තුල
iii. ජන සන්නිවේදනය තුල iv. සංවර්ධන ව්‍යාපෘගතියකදී
v. මාධ්‍ය ආයතන එකට සජීවි විකාශනයන් ගෙන ඒමේදී

40. සාම්ප්‍රදායික සමාජයන්හි නව හැකියාවන් ව්‍යාප්ත කරලීම සඳහා ජනමාධ්‍ය භාවිතයට ගත හැකි බව ප්‍රකාශ කළේ,
i. ලැස්වෙල් ii. ශ්‍රාම් iii. ලූෂන්පායි iv. එවරට් එම් රොජර් v. ඩඩ්ලි සියර්ස්

41. " ආචාරශීලී කථා කිරීම " යනු හඳුනාගත හැක්කේ,
i. භාෂණයයි ii. මනා සන්නිවේදකයාගේ සතු කුසලතාවයයි iii. රූපණයයි
iv. භාෂාවේ ඇති විශිෂ්ඨතාවයයි v. පෙළඹවීමයි

42. මාධ්‍ය මගින් සිදුවන සමාජානුයෝජනය
A සමාජ පාලන ක්‍රියාවලියක් ලෙස බොහෝවිට සැලකේ
B. සමාජයේ සාමාජිකයින්ට සිය භූමිකාව කවර ලෙසද යන්න පැහැදිලි කරයි
C. විවිධ සමාජ ක්‍රියාකාරකම් සිදුවන ආකාරය විවරණය කරයි.
D. සාම්ප්‍රදායික සංස්කෘතිය ප්‍රතිපෝෂණය කරයි.
ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ,
i. AB සත්‍යය ii. ABC සත්‍යය iii. ABCD සත්‍යය iv. AC සත්‍යය v. සියල්ල අසත්‍යය

43. මාධ්‍ය විචාරකයා ගැන නොගැලපෙන ප්‍රකාශයක් විය නොහැක්කේ,
i. බුද්ධිමත් ග්‍රාහකයෙකු වේ
ii. සාමාන්‍ය ග්‍රාහකයන්ට වඩා වෙනස් අයුරින් මාධ්‍ය විමර්ශනය කරයි.
iii. සැමවිටම මාධ්‍යවේදීන්ටත්, මාධ්‍යයටත්, ඒවායේ නිර්මාණයන්ටත් ප්‍රශංසා කරයි
iv. මාධ්‍ය කර්මාන්තය පවත්වාගෙන යාමට උපකාරී වේ.
v. සද්භාවයෙන් යුතුව මාධ්‍ය නිර්මාණ විවේචනය කරයි.

44. සන්දේශය වඩාත් හොඳින් විස්තර වන්නේ කවර ආකෘතියකද ?
i. ලැස්වෙල් ii. බර්ලෝ iii. ශ්‍රාම් - ඔස්ගුඩ් iv. ඇරිස්ටෝටල් v. වීවර්

45. නිර්මාණාත්මක සන්දේශයක දැක ගත හැකි වැදගත්ම ලක්ෂණය වන්නේ,
i. කල්පිත බව ii. ශ්‍රව්‍ය දෘශ්‍ය බව iii. විචිත්‍ර බව iv. අපූර්වත්වය v. ප්‍රසාංගික බව

46. ජන මාධ්‍ය මගින් ජන මතය සකස් කිරීම සිදු කරනු ලබන්නේ,
A තොරතුරු ප්‍රවාහයට මැදිහත් වීමෙන්
B තොරතුරු ප්‍රවාහය තෝරා ගැනීමෙන්
C හැසිරීමෙන්
ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,
i. A ii. B iii. C iv. B, C v. සියල්ලම

47. ගැටුම් සමාජයෙහි ප්‍රගමනයට හේතු වන අවස්ථාවක් ලෙස යොදා ගත හැක්කේ
i. නිරාකරණය තුලින් ii. මැඩ පැවැත්වීම තුළිනි iii. කළමණාකරණය තුලිනි
iv. සමථකරණය තුලිනි v. විපරිවර්තනය තුලිනි.

48. මහජන සම්බන්ධතාවය පිළිබඳව නොගැලපෙන්නේ,
i. මහජනතාව අත්‍යාවශ්‍ය පාර්ශවකරුවෙකි
ii. සැමවිට මුදල් ගෙවා සිදුකරන්නකි.
iii. සබඳතා ගොඩනැංවීම ප්‍රමුඛතම කාර්යයකි.
iv. විවිධ පාර්ශව වලට වාසි ගෙන දේ
v. සුභවාදි දැනුවත්කිරීම මූලික කරුණකි

49. ග්‍රාහකයා පිළිබඳව නිදොස් ප්‍රකාශය වන්නේ,
i. දෙදෙනෙකු නොමැති තැන ග්‍රාහකයෙකු නොසිටීමයි
ii. ග්‍රාහක භූමිකාව ස්ථිරව පැවතීමයි
iii. ග්‍රාහකයාට සැම විට අර්ථකථනය කිරීමේ කුසලතා පැවතීමයි
iv. ග්‍රාහක සාක්ෂරතාවය සම මට්ටමේ නොපැවතීමයි
v. ග්‍රාහකයාගේ වින්දන ක්ෂේත්‍රය පුළුල්ව පැවතීමයි.

50. විද්‍යුත් මාධ්‍ය ආයතන පිහිටවීමේලා තරඟකාරීත්වයක් උද්ගතවී ඇත්තේ,
i. දේශපාන පවුල් බල සම්බන්ධතාවය නිසා
ii. සීමිත සම්පතක් වන සංඛ්‍යාත පද්ධතිය මත පදනම් වන නිසාය
iii. වාණිජ ව්‍යාපාර ආයතන වල සෘජු දායකත්වයක් පවතින නිසාය
iv. සමාජයේ ජන මත නිර්මාණයන්ට පුළුල් ලෙස මැදිහත් වන නිසාය.
v. ජන සන්නිවේදන ක්‍රියාවලියට පහසුකම් සපයන්නෙක් වන නිසාය.

LIBRARY COPY

# ද මැසනඩ් විද්‍යාලය

Sunanda Udagamage

2016 උසස් පෙළ විභාගයට පෙනී සිටින සිසුන් වෙනුවෙන් පැවැත්වෙන කඩයිම් වාර පරීක්ෂණය

19-02-2016

## 2016 අප්‍රේල්

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය.

Learning Resource Center
De Mazenod College
Kandana

කාලය පැ. 03

■ ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

## II - කොටස

01. i. ගෝලීයකරණය කෙටියෙන් හඳුන්වන්න

ii. ගෝලීයකරණය නිසා සිදුවන සමාජ ප්‍රවණතා 3 ක් කෙටි විස්තර සහිතව පැහැදිලි කරන්න.

iii. සන්නිවේදනය පුද්ගල අවශ්‍යතා සඳහා අවශ්‍ය වන අයුරු කරුණු 3 කින් දක්වන්න

iv. ''සන්නිවේදනය සහ සමාජ සංවර්ධනය'' යන මාතෘකාව ඔස්සේ කරුණු 3 ක් සහිතව කෙටි විස්තර දක්වන්න.

02. i. ලිඛිත සන්නිවේදනය හඳුන්වන්න.

ii. ලිඛිත සන්නිවේදනයේ වාසි 3 ක් සහ අවාසි 03 ක් සඳහන් කරන්න.

iii. විධිමත් සන්නිවේදනයේදී සහ අවිධිමත් සන්නිවේදනයේදී සන්නිවේදකයා, ග්‍රාහකයා, සන්දේශය යන කරුණු 3 හි ස්වභාවය විස්තර කරන්න.

iv. S.M.C.R. සන්නිවේදන ආකෘතියේ සමාජ විද්‍යාත්මක බව පෙන්වන කරුණු 4 ක් සඳහන් කර ඒවා ගැන කෙටි විස්තර සපයන්න.

03. i. මහජන සම්බන්ධතාවය පිළිබඳ ඉන්දියානු සහ බ්‍රිතාන්‍ය නිර්වචන සඳහන් කරන්න.

ii. ආයතනයක අභ්‍යන්තර ප්‍රජාව සහ භාහිර ප්‍රජාව හඳුන්වා දෙන්න.

iii. පාසල් නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේදී පාසලේ මහජන සම්බන්ධතාවය තහවුරු වන අයුරින් එය සංවිධානය කරන්නට ඔබට පැවරී ඇත්නම් ඒ සඳහා අනුගමනය කරන ක්‍රියා මාර්ග 4 ක් සඳහන් කරන්න.

iv. ''ඡායාරූපය '' මහජන සම්බන්ධතා මෙවලමක් ලෙස ප්‍රයෝජනයට ගත හැකි අයුරු කරුණු 4 ක් මගින් විස්තර කරන්න.

04. i. ජාතික ගීය ද්‍රවිඩ භාෂාවෙන් ගායනා කිරීම පිළිබඳව සමාජය තුළ ඇති විය හැකි යහපත් සන්නිවේදන ප්‍රවණතා 3 ක් විස්තර කරන්න.

ii. ශිලාලේඛන, පැපිරස් පුවරු, කඩදාසි ආදිය උපයෝගී කරගෙන ගමන් කළ ලිඛිත සන්නිවේදනය නූතනයේ පරිගණක තිරයක් මත සිදු කරන අවස්ථාවන් දැකිය හැක. මීට වසර කීපයකට පෙර බහුලව භාවිතා වූ ලිපිය වෙනුවට ඊ මේලය දැන් දැන් බොහෝ දෙනා අතර ප්‍රචලිත වී ඇත. තම අත් අකුරින් ලියවෙන ලිපිය සහ ඊමේල් ලිපිය අතර වෙනස්කම් 4 ක් විස්තර කරන්න.

iii. ජනමාධ්‍ය තුලින් සිදුවන සමාජානුයෝජනය කරුණු 4 ක් මගින් සඳහන් කරන්න.

iv. සමූහ සන්නිවේදනයේ සන්නිවේදකයා සතුව තිබිය යුතු ගුණාංග 4 ක් විත්ර කරන්න.

05. i. මාධ්‍ය හා සංස්කෘතිය අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

ii. මාධ්‍ය සංස්කෘතිය ජන සංස්කෘතියට බලපෑම් කරන ආකාර 2 ක් දක්වන්න.

iii. මාධ්‍ය විචාර ප්‍රවේශය හඳුන්වා දී එහි ලක්ෂණ නම් කරන්න.

iv. බහුජන මාධ්‍යයේ සමාන අසමානතා කෙටියෙන් පැහැදිලි කරන්න.

06. i. ගැටුම යනු කුමක්දැයි කෙටියෙන් පැහැදලි කරන්න.

ii. මාධ්‍ය ප්‍රචණ්ඩත්වය දැක ගත හැකි ආකාර 4 නම් කරන්න.

iii. ගෘහස්ත සාමය හා සහජීවනයට හේතු සාධක වන කරුණු 4 ක් නම් කර ඉන් 2 ක් පැහැදිලි කරන්න.

iv. ජීව භාෂාවක් සතු ලක්ෂණ 4 ක් ලියන්න.